**මාලිම්බඩ ප්‍රාදේශීය සභාව - 2023**

**------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් වියදම් ගිණුම, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරු ද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභික ඉන්ධන දීමනාව රු.68,400 ක් හා කර්මාන්ත 07 කට අදාල ණය හිමි ශේෂය රු.2,558,373 ක් වැඩියෙන් ගිණුම්ගත කිරීම නිසා විවිධ ණයහිමි ශේෂය හා ප්‍රාග්ධන ණය හිමි ශේෂය වැඩි වී තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | ගොඩනැගිලි 2 ක් සංවර්ධනය සඳහා දරන ලද රු.1,540,117 ක වියදම ඉඩම් හා ගොඩනැගිලි යටතේ ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | ලැබිය යුතු මුද්දර ගාස්තු රු.1,734,322 ක් යෙන් හා ලැබිය යුතු උසාවි දඩ රු.207,131 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | වටිනාකම රු.185,000 ක් වූ බොකටුගහහේන ජන උදාන ගම්මානය ප්‍රජා ශාලාවෙහි වටිනාකම ඉඩම් හා ගොඩනැගිලි යටතේ ගිණුම් ගත කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාතර්ා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 04 කට අදාලව මූල්‍ය ප්‍රකාශන ශේෂයන් හා ඊට අදාල උපයෝගී ලේඛණ/උපලේඛන වල දැක්වෙන ශේෂයන් අතර රු. 106,941,520 ක වෙනසක් පැවතිණි. | ඉදිරියේදී නිවැරදි කරන බව. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.94,146 ක් වූ ගිණුම් විෂයන් 6 ක් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ පුනරාවර්තන ආදායම රු.15,269,110 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ පුනරාවර්තන ආදායම රු.8,459,120 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 4,335,700 | 1,994,663 | 1,909,010 | 218,547 | 3,935,700 | 262,074 | 304,902 | 132,894 |
| (ii) | කුලී | 9,147,500 | 3,173,969 | 3,097,857 | 304,513 | 7,647,500 | 2,883,350 | 3,481,238 | 228,401 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,363,000 | 980,675 | 1,108,875 | - | 907,000 | 1,239,140 | 1,337,940 | 128,200 |
| (iv) | වෙනත් ආදායම් | 7,764,300 | 11,300,079 | 11,304,599 | 195,912 | 4,626,400 | 4,223,865 | 4,518,905 | 200,432 |
| | | 22,610,500 | 17,449,386 | 17,420,341 | 718,972 | 17,116,600 | 8,608,429 | 9,642,985 | 689,927 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කායර්සාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදේශ්ශය |
|---|---|---|---|
| | --------------------- | ---------------- | ---------- |
| (අ) | වරිපනම් ඒකක 68 කට අදාලව හිඟ ශේෂය රු.67,844 ක් වූ අතර ඉන් රු.32,383 ක් වර්ෂ 2 කට වැඩිවිය. | අදාල හිඟයෙන් 2024 මාර්තු 31 දින වන විට රු.25,247 ක මුදලක් අය වී ඇති බව | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතුය. |
| (ආ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (1) වන වගන්තිය ප්‍රකාරව සභා බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශ ලෙස ග්‍රාම නිලධාරී කොට්ඨාස 17 කට අයත් වර්ග කිලෝමීටර් 30 ක පමණ ප්‍රමාණයක් හඳුනාගෙන තිබූ අතර 2022 සැප්තැම්බර් 30 දිනැති අංක 2300 දරන ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කර තිබුණි. වරිපනම් බදු අය කිරීම සඳහා දේපළ 600 ක් පමණ හඳුනාගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානය වන විට එම ගැසට් නිවේදනය ප්‍රකාශයට පත් කර වසරකට අධික කාලයක් ගතවී තිබුණද තක්සේරු ප්‍රමාදවීම හේතුවෙන් වරිපනම් බදු අය කර ගැනීමට නොහැකිවී තිබුණි. | නව වරිපනම් බල ප්‍රදේශ පුළුල් කිරීමට අදාලව තක්සේරුව සිදු කර දෙන ලෙස තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ලිඛිතව ඉල්ලීම් කර ඇති බව. | තක්සේරුව කඩිනමින් ලබා ගෙන වරිපනම් අය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සභාව සතු වෙළෙඳ සංකීර්ණ 2 හි කඩ කාමර 43 න් කඩ කාමර 42 ක් බදුදී තිබූ අතර ඉන් කඩ කාමර 18 කින් රු.267,830 ක හිඟ ආදායමක් අයවිය යුතුව පැවතුනි. ඉන් රු.34,125 ක ශේෂයක් අවුරුදු 2 කට අධික කාලයක සිට අයවිය යුතුව පැවතුනි. | 2023 අප්‍රේල් 01 දින වන විට රු.23,575 ක් අය කර ගෙන ඇති බවත්, ඉතිරිය ක්ෂේත්‍ර චාරිකා හා දැනුවත් කිරීමේ ලිපි මගින් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතුය. |
| (ඈ) | සභාව සතු කඩ කාමර 14 ක් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන වසා දමා තිබූ අතර එහි ඉහළ මහලට ප්‍රවිෂ්ය වීමට එක් පඩිපෙළක් පැවතීමත් එම කඩ කාමර ප්‍රධාන මාර්ගයෙන් ආවරණය වී පැවතීමෙන් ගනුදෙනුකරුවන් නොපැමිණීමත් නිසා වසා දැමීමකට හේතු වී තිබුණි. එහි කඩ කාමර 07 කින් රු.133,235 ක කුලී මුදලක් සමාලෝචිත වර්ෂය අවසානයට අය විය යුතුව පැවතුණි. | 2023 අප්‍රේල් 01 දින වන විට රු.128,150 ක් අය කර ගෙන ඇති බවත්,ඉතිරිය ක්ෂේත්‍ර චාරිකා හා දැනුවත් කිරීමේ ලිපි මඟින් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතුය. |
| (ඉ) | දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ අංක ද.ප.පා/ප.පා.කො/2010/01 හා 2010 දෙසැම්බර් 27 දිනැති චක්‍රලේඛයේ 11 ඡේදයේ විධිවිධාන වලින් බැහැරව සභාව සතු කඩ සංකීර්ණයේ කඩ කාමර 03 ක් වෙනත් පාර්ශවයන් වෙත අතුරු බදුදී තිබුණි. | ගිවිසුම් උල්ලංඝනය කරන කඩ බදු හිමියන් සඳහා නීතිමය කටයුතු සිදු කරන බව. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | පොළ හා මස් කඩ බදු දීම තුලින් අයවිය යුතුව පැවති ශේෂය රු.36,683 ක් වූ අතර එම ශේෂය වසර 5 කට අධික කාලයක සිට විය. | හිඟ ශේෂයන්ට අදාලව නඩු වාර්තා අළුත් කර අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතුය. |
| (උ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.415,120 ක් හා මුද්දර ගාස්තු රු. 40,516,304 විය. | මුද්දර ගාස්තු හා උසාවි දඩ මුදල් මාසිකව ලැබෙමින් පවතින බව. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කායර්න් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) | අළෙවි කළ නොහැකි නොදිරන කසළ බැහැර කිරීමට සභාවට විධිමත් වැඩපිළිවෙලක් නොතිබුණු බැවින් ඒවා කොම්පෝස්ට් භූමියෙහිම පස් දමා වසා දමන බව විගණනයට නිරීක්ෂණය විය. | නොදිරන කසල ගාල්ල මොන්රෝවියාවත්ත කසල කළමණාකරණ ඒකකය වෙත යොමු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව | විධිමත් කසල කළමනාකරණ සැලැස්මක් ක්‍රියාත්මක කළ යුතුය. |
| (ආ) | 2013 වර්ෂයේදී සුල්තානාගොඩ කැකිල්ල ප්‍රදේශයේ රූඩ් 03 ක භූමිය තුළ සභාව විසින් කසළ කළමනාකරණ ව්‍යාපෘතිය ආරම්භ කර තිබූ අතර වසර 11 කට ආසන්න කාලයක් ගත වී තිබුණද මධ්‍යම පරිසර අධිකාරිය වෙතින් පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි. | පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබා ගැනීමට කඩිනමින් කටයුතු කරන බව. | පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි අක්කර 01 පර්චස් 36 කින් යුක්ත ඉඩමක් කැබලි කර විකිණීමේදී මාර්ග නියමිත ප්‍රමිතීන්ට සකස් කළ බවට වරලත් ඉංජිනේරුවරුන්ගේ වාර්තාවක් ලබාගෙන තිබුණද, ඉඩමේ අභ්‍යන්තර ප්‍රවේශ මාර්ගය ආරම්භයේ සිට මීටර් 24.5 ත් 27.5 ත් අතර කොටසේ තාර ඇතිරුම ගිලා බැස තිබුණි. | තාර ඇතිරුම ගිලා බැස ඇති කොටසෙහි කොන්ක්‍රීට් ඇතිරීම සිදු කර ඇති බව. | නිසි ප්‍රමිතීන්ට සංවර්ධන කටයුතු සිදු කළ යුතුය. |
| (ආ) | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ රූඩ් 01 පර්චස් 37 ක ප්‍රමාණයකින් යුත් ඉඩම කැබලි කර නේවාසික භාවිතය සඳහා කොන්දේසි රහිතව 2022 ජුනි 09 දිනැති අංක 209 දරන සැලසුම් කමිටුව විසින් තීරණය කර තිබූ අතර, අනුකූලතා සහතිකය ලබා දීමෙන් තොරව ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කරමින් ඉඩම විකිණීමේ කටයුතු ආරම්භ කර තිබුණි. මෙය නාගරික සංවර්ධන නියෝග/රෙගුලාසි ඇතුලත්ව 2021 ජූලි 08 දිනැති අංක 2235/54 දරන ගැසට් නිවේදනයේ II වන කොටසේ 27(1) හා 27(3) විධිවිධානවලින් බැහැරව කටයුතු කිරීමක් විය. | ප්‍රචාරණ පුවරු ඉවත් කර ඇති බවත් ඉඩම් කොටස් විකිණීමක් සිදු කර නොමැති බව. | ගැසට් නිවේදනය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනතේ 2016 සිට 2020 දක්වා කාලපරිච්ඡේදය තුළ ගොඩනැඟිලි අයදුම්පත්‍ර 576 ක් අනුමත කර ගොඩනැඟිලි සංවර්ධන බලපත්‍ර ලබා දී වසර 03 ත් වසර 07 ත් අතර කාලයක් ගතවී තිබූ නමුත් ගොඩනැඟිලි 12 කට පමණක් අනුකූලතා සහතික ලබාගෙන තිබූ අතර එය අනුමත කළ ගොඩනැඟිලි අයදුම්පත් සංඛ්‍යාවෙන් සියයට 2 ක් විය. | අනුකූලතා සහතික ලබා ගන්නා ලෙස දැනුවත් කිරීම් සිදු කර ඇති බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) | ප්‍රාදේශීය සභා බලප්‍රදේශයට අයත් ග්‍රාම නිලධාරී වසම් 29 කින් වසම් 05 ක මාර්ග හඳුනාගෙන මැනුම් කටයුතු අවසන් කර තිබුණද එම මාර්ග සිතියම්ගත කිරීමේ කටයුතු සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අවසන් කර නොතිබුණි. | මාර්ග සිතියම් ගත කිරීමේ කටයුතු කඩිනමින් අවසන් කරන බව. | මාර්ග සිතියම් ගත කිරීමේ කටයුතු කඩිනමින් අවසන් කළ යුතු බව. |
| (ඉ) | 2021 නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා සංවර්ධන නියෝග/රෙගුලාසි ඇතුළත් 2021 ජූලි 08 දිනැති අංක 2235/54 දරන ගැසට් නිවේදනයේ 28(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ ඉදිකර තිබූ හෝ ඉදිකරමින් පැවති ගොඩනැගිලි 08 ක් සඳහා සංවර්ධන බලපත්‍ර ලබාගෙන නොතිබුණි. ඉන් ගොඩනැගිලි 6 ක් ඉදිකිරීමේදී ගොඩනැගිලි සීමාවන් හා නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් හා සංවර්ධන නියෝග/ රෙගුලාසිවලට අනුකූලව ඉදිකිරීම් සිදුකර නොතිබුණි. | සංශෝධිත සැලසුම් ඉදිරිපත් කරන ලෙස දැනුවත් කර ඇති බව. | ගැසට් නිවේදනය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**3.3 මතභේදයට තුඩු දෙන ගනුදෙනු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සම්මේලනයක් සඳහා සභාවේ නිලධාරීන්ට අවශ්‍ය ප්‍රවාහන පහසුකම් සැලසීම වෙනුවෙන් 2022 හා 2023 වර්ෂවලදී රු.100,100 ක් බාහිර පාර්ශවයක් වෙත ගෙවා තිබුණි. මෙවැනි ගෙවීම් සඳහා කිසිඳු නෛතික ප්‍රතිපාදනයක් සලසා නොතිබියදීත් මේ ආකාරයෙන් වෘත්තීය සමිති සම්මේලන සඳහා නිලධාරීන්ට සහභාගීවීමට ප්‍රවාහන පහසුකම් සැලසීම සඳහා පෞද්ගලික පාර්ශවයන් වෙත සභා අරමුදලින් ගෙවීම් කිරීම නෛතික ගෙවීමක් නොවීය. | ආණ්ඩුකාරවරගේ උපදෙස් ලිපිය ප්‍රකාරව කටයුතු කළ බව. | ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2018 මාර්තු 09 සිට 2023 මාර්තු 09 දක්වා සම්මත කරන ලද ප්‍රාදේශීය සභා සභිකයන්ගේ ධූර කාලය 2023 මාර්තු 19 දක්වා දීර්ඝ කළ අතර 2023 මාර්තු 19 දිනෙන් සභාවේ නිල කාලය අවසන් වුවද, 2023 මාර්තු මාසය වෙනුවෙන් සභික දීමනා අනුපාතිකව ගෙවීම් කළ යුතු වුවද, එසේ සිදු නොකිරීම නිසා සභිකයින් 09 දෙනෙකු වෙත රු.52,254 ක් වැඩිපුර ගෙවා තිබුණි | අය කර ගැනීම සඳහා සිහි කැඳවීම් ලිපි යොමු කර ඇති බව. | නිවැරදිව ගෙවීම් සිදු කළ යුතුය. |

**3.4 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2015 වර්ෂයේදී සභාවට ලැබී තිබූ ගල්රෝල භාවිතයට නොගෙන 2017 වර්ෂයේ සිට තෙලිජ්ජවිල පැරණි ප්‍රාදේශීය සභා ගොඩනැගිලි පරිශ්‍රයේ නිශ්කාර්යව හා අනාරක්ෂිතව ගාල් කර තිබුණි. | යන්ත්‍රය හුවමාරුව සඳහා කිසිඳු රාජ්‍ය ආයතනයක් වෙතින් ප්‍රතිචාරයක් ලැබී නොමැති බැවින් දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත දැනුම් දී ඇති බව. | සභාව සතු වාහන ඵලදායි ලෙස භාවිතා කළ යුතුය. |

## 3.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ඉදිකිරීමේ පිරිවැය රු.327,326 ක් වූ මාළු ලැලි 08 න් 2 ක් කඩා වැටී තිබූ අතර එම කඩා වැටුනු වහල අදාල පාර්ශවයන් ලවා ඉදිකරවා ගැනීමට හෝ අලාභ අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් කටයුතු කර නොතිබුණි. | පිළිසකර කිරීම සඳහා අදාල කොන්ත්‍රාත් සමිතියට දැනුම් දී ඇතත් ඒ සඳහා ඔවුන් එකඟ වී නොමැති බව. | නියමිත ප්‍රමිතියෙන් යුක්තව කොන්ත්‍රාත් වැඩ කොටස් ඉටුකරවාගත යුතුය. |

## 3.6 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සභාව විසින් 2018 සැප්තැම්බර් 10 දින කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන තිබූ සෞඛ්‍ය කම්කරුවෙකු වෙත 2022 ජනවාරි 16 දින ටිපර් රථයේ රියදුරු ලෙස රාජකාරි පවරා තිබුණ අතර 2023 ජනවාරි සිට 2023 දෙසැම්බර් දක්වා කාලය තුළ රු.396,817 ක් වැටුප් හා දීමනා ලෙස සභා අරමුදලින් වැය කර තිබුණි. | බඳවා ගෙන ඇති තනතුරට අදාලව වැටුප් හා දීමනා ගෙවා ඇති බව. | බඳවාගත් තනතුරට අදාලව රාජකාරී පැවරිය යුතුය. |